# දැන්වීමයි

## දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම - 2021

දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :** ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I ශ්‍රේණියේ වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය.
අයදුම්කරු පසුගිය වසර 05 තුළ කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවූ අයෙකු විය යුතුය.

**අයදුම්පත්‍ර යොමු කළ යුතු ක්‍රමය :**

මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ 4 (සෙ.මී. 21 X සෙ.මී. 29) ප්‍රමාණයේ කඩදාසි භාවිත කර අයදුම්පත්‍ර සකස් කර ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.07.16 වන දින හෝ ඊට පෙර ලේකම්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 6 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, ගාල්ල ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම - 2021"** යන්න සඳහන් කරන්න. අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් එවිය යුතුය.

නියමිත ආකෘතියට අනුකූල නොවන, නියමිත සුදුසුකම් සපුරා නොමැති, අසම්පූර්ණ අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම පුවත්පත් නිවේදනයේ සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**ගාමිණී වීරවික්‍රම**
**ලේකම්,**
**දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.**

**දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,**
**6 වන මහල,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, ගාල්ල.**

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි කිසිදු වගකීමක් දරනු නොලැබේ)

## දකුණු පළාත් කෘෂිකර් දෙපාර්තමේන්තුවේ

### අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම - 2021

| | | | |
|---|---|---|---|
| 1.0 | 1.1 | මුලකුරු සමග නම | : |
| | 1.2 | සම්පූර්ණ නම | : |
| | 1.3 | ජාතික හැඳුනුම්පත් අංකය | : |
| 2.0 | 2.1 | පුද්ගලික ලිපිනය | : |
| | 2.2 | රාජකාරි ලිපිනය | : |
| | 2.3 | ජංගම දුරකථන අංකය | : |
| | 2.4 | රාජකාරි දුරකථන අංකය | : |
| 3.0 | 3.1 | උපන් දිනය | : |
| | 3.2 | 2021.07.16 දිනට වයස | : |
| 4.0 | 4.1 | වර්තමාන තනතුර | : |
| | 4.2 | සේවය | : |
| | 4.3 | රාජ්‍ය සේවයේ මුල් පත්වීමේ දිනය | : |
| | 4.4 | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයට පත්වූ දිනය | : |
| | 4.5 | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ 1 ශ්‍රේණියට පත් වූ දිනය | : |
| | 4.6 | 2021.07.16 දිනට ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සේවා කාලය | : |
| | 4.7 | 2021.07.16 දිනට රජයේ සේවයේ සේවා කාලය | : |
| | 4.8 | පළාත් රාජ්‍ය සේවයේ මුළු සේවා කාලය | : |
| 5.0 | 5.1 | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවාවේ දරන ලද තනතුරු | |

| තනතුර | කාල පරාසය |
|---|---|
| .................................... | .................................... |
| .................................... | .................................... |

| | | | |
|---|---|---|---|
| 6.0 | 6.1 | අධ්‍යාපන සුදුසුකම් | : |
| 7.0 | 7.1 | සුදුසුකම් හා පළපුරුද්ද | : |
| | 7.2 | විශේෂ සුදුසුකම් | : |

8.0 **සහතිකය**

I. මා විසින් සපයා ඇති ඉහත තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්,

II. උක්ත තනතුර සඳහා මා තෝරාගනු ලැබුවහොත් මාගේ උපරිම ශක්තිය හා කැපවීමකින් යුතුව සේවය කිරීමට එකඟ වන බවත්, ප්‍රකාශ කරමි.

දිනය : ....................................                                    අත්සන : ....................................

9.0 **ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :**

ඉහත සඳහන් තනතුරට අයදුම් කර ඇති ................................................ මයා / මෙය / මිය සුදුසුකම් ලබන / නොලබන බව සඳහන් කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි / නිර්දේශ නොකරමි. තවද මෙම සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව ඔහු / ඇය දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරන තනතුරෙන් මුදාහැරීමට එකඟ වෙමි / එකඟ නොවෙමි.

දිනය : ....................................                                    ..........................................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව